**පිටබැද්දර ප්‍රාදේශීය සභාව.**

**මාතර දිස්ත්‍රික්කය.**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 29 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 පෙබරවාරි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 වත්කම් හා වගකීම් නිරවුල් කිරීම

2005 දෙසැම්බර් 01 දිනැති අංක : 1421/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර තබූ නිවේදනය අනුව පිටබැද්දර ප්‍රාදේශීය සභාව ස්ථාපනය කර තිබුණද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ දක්වා ඇති නියමයන්ට අනුකූලව කොටපොල ප්‍රාදේශීය සභාව සහ පිටබැද්දර ප්‍රාදේශීය සභාව අතර වත්කම් හා වගකීම් නිරවුල් කර ගැනීම 2011 අගෝස්තු 17 විගණන දිනය වනවිටත් සිදුකර නොතිබුණි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

1.4.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව නිදහස් කර ගැනීමට ඉඩදුන් රු.28,797 ක් වූ එකතු කළ අගය මත බදු මුදල, ආදායම් භාවියදම් ගිණුමට බැර නොකොට අධිකතා හා ඌනතා ගිණුමට ජර්නල් සටහන් 39 මගින් බැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු සඳහා රු.1,965,530 ක් අඩුවෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව දේපල ණය සඳහා රු.74,055 ක් වූ රාජ්‍ය දායකය, ලැබිය යුතු දේපල ණය පොලී ගිණුමට බැර නොකොට වෙනත් ආධාර ගිණුමකට ජර්නල් සටහන් 50 මගින් බැර කර තිබුණි.

(ඇ) සභාවට, කොටපොල ප්‍රාදේශීය සභාවෙන් පවරා තිබූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගණනය කර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන වල දීර්ඝ කාලීන වගකීම් යටතේ දැක්විය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.1,979,028 ක් වූ ණය ශේෂය සදොස් ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට මල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් තොගයේ වටිනාකම රු.1,874,306 ක් වූ නමුත් පරිග්‍රහණ ලේඛණ අනුව සකස් කල උපලේඛණයට අනුව වටිනාකම රු.1,880,115 ක් වී තිබුණෙන් වෙනස රු.5,809 ක් විය.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ශේෂය රු.1,466,344 ක් වුවද උපලේඛණය අනුව ශේෂය රු.1,595,504 ක් වූයෙන් වෙනස රු.129,160 ක් විය.

1.4.2 <u>ගෙවිය යුතු ගිණුම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණම් ශේෂවල වටිනාකම රු.6,131,360 ක් විය.

1.4.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

(අ) ගිණුම් විෂයයන් 08 කට අයත් රු.52,837,191 ක් වටිනා ශේෂයන් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා, අයිතිය හා පැවැත්ම තහවුරු කෙරෙන ලිපිලේඛණ, උපලේඛණ, කාල විශ්ලේෂණ ආදිය නොමැතිකමින් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) පොදු ගබඩා තොග ගිණුමේ ඇතිවූ වෙනස සඳහා රු.45,324 ක් ජර්නල් සටහන් අංක 60 මගින් බැරට හා අධිකතා ඌනතා ගිණුමට හරට සටහන් යොදා තිබුණද ඒ පිළිබඳ පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොවිණි.

1.5 <u>අනුකූල නොවීම්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති | | |
| (i) | රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර කෙටි අත්සන් තැබීම මගින් තහවුරු කර නොතිබුණි. |
| (ii) | රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය ශේෂය සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණය කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ. 507 | අතැති තොගවල අගය වාර්ෂිකව ගිණුම්වල ඇතුලත් කිරීම සඳහා වර්ෂය අවසන් දිනට භෞතික සත්‍යාපනය කර ස්ථාවර වත්කම් වල පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි-2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.65,574 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.379,895 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් ඇතුළු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 පෙබරවාරි 23 දිනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතයක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද, අවසන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | % | % |
| | රු. | රු. | | |
| වරිපනම් හා අක්කර බදු | 207,890 | 180,090 | 15.44 | - |
| බදු කුලී | 2,350,311 | 1,075,504 | 118.53 | - |
| බලපත්‍ර ගාස්තු | 70,522 | 72,272 | - | 2.42 |
| වෙනත් | 17,864,807 | 12,864,226 | 38.87 | - |

#### 2.2.2 හිඟ වරිපනම් බදු හා අක්කර බදු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතු රු.207,890 ක වරිපනම් බදු හා අක්කර බදු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 කින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත ඒවා ඇති රු.445,407 ක්වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.1,342,793 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.5 එක්වන් මුදල් අයකර නොතිබීම.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට සතිපොල කඩකාමර 04 කින් එක්වන් මුදල වූ රු.150,000 ක් අයකර ගෙන නොතිබුණු අතර ගිණුම්ගතකරද නොතිබුණි.

2.2.6 දුරකථන/විදුලි සංදේශ කුළුණු, ගාස්තු අයවීම.

සභා බල ප්‍රදේශයේ සවිකර තිබූ දුරකථන/විදුලි සංදේශ කුළුණු 08 කින් නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයාගේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් පත්‍රයේ (v) උපලේඛණයේ 6 (v) පරිදි පළකර තිබූ නියමය අනුව ආවරණ අනුමැතිය දීමේදී පෙරසැර ගාස්තු වශයෙන් රු.493,360 ක මුදලක් අඩුවෙන් අයකර තිබූ අතර අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු වශයෙන් රු.42,500 ක් අයවී නොතිබුණි.

2.3 වියදම් ව්‍යාහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 10,475 | 8,836 | 1,639 | 10,387 | 8,387 | 2,000 |
| අනෙකුත් | 7,661 | 3,899 | 3,762 | 6,437 | 5,245 | 1.192 |
| උප එකතුව | 18,136 | 12,735 | 5,401 | 16,824 | 13,632 | 3,192 |
| ප්‍රාග්ධන වියදම | 70,085 | 14,635 | 55,450 | 69,890 | 9,984 | 59,906 |
| එකතුව | 88,221 | 27,370 | 60,851 | 86,714 | 23.616 | 63,098 |

2.4 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 |
| ද්විතියික | 12 | 09 |
| ප්‍රාථමික | 17 | 16 |
| වෙනත්/අනියම්/ තාවකාලික | - | 18 |

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 18 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේ වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.1,551,789 ක් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ලේඛණය අනුව කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු.8,836,156 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.7,947,000 ක් පමණි. මේ අනුව රු.889,156 ක් වූ වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය.

අයවිමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට ලේඛණ අනුව අයවිය යුතුව තිබූ සේවක ණය සහ අත්තකාරම් ශේෂ වල එකතුව රු.1,466,344 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.6.1 අංක RS - 1126 දරණ බැකෝ යන්ත්‍රය.

2007 වර්ෂයේ රු.5,000,000 කට දේශය ණය හා සංවර්ධන අරමුදලේ ණය මුදලින් මිලදී ගත් මෙම යන්ත්‍රය
2012 සැප්තැම්බර් 30 දින වන විට ණයවාරික හා පොලී ගෙවූ පසු පිරිවැය රු.6,122,247 ක් වන අතර 2010 දෙසැම්බර් 31 දිනට ගෙවන ලද වටිනාකම රු.3,981,762 ක් විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය සඳහා අලුත්වැඩියා, ඉන්ධන, රියදුරු වැටුප්, ණයවාරික හා පොලී වියදම රු.2,461,706 ක් විය. එහෙත් යන්ත්‍රය වැඩෙහි යෙදවීම පිළිබඳ ලේඛණයක්, ඉන්ධන යෙදීම, සේවා කිරීම් හා අළුත්වැඩියා කිරීම්, බාහිර පාර්ශවයන්ට කුලියට දීම් පිළිබඳව විධිමත් ලේඛණ නඩත්තු කර නොතිබුණි.

(ආ) ණය වාරික හා පොලී ගෙවීමෙන් පසු යන්ත්‍රයේ වටිනාකම රු.6,122,247 ක් වුවද මල්‍ය ප්‍රකාශන වල වටිනාකම රු.7,300,000 ක් ලෙසට දක්වා තිබුණෙන් වෙනස රු.1,177,753 ක් විය.

2.6.2 වීථි පහන් නඩත්තුව

සමාලෝචිත වර්ෂය තුල විදුලි උපකරණ හා උපාංග මිලදී ගැනම සඳහා රු.135,010 ක මුදලක් වැයකර තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වීථිපහන් නඩත්තුව වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණෙන් සභා අරමුදලින් දරණ ලද වියදම ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) වීථි පහන් නඩත්තුව සඳහා උපාංග මිලට ගැනීමේදී අවශ්‍යතාවය හා සවිකල යුතු බල්බ වර්ග, සවිකළ යුතු ස්ථාන පිළිබඳ ඇස්තමේන්තු කිරමකින් තොරව කටයුතු කර තිබුණි.

2.6.3 ප්‍රාදේශීය සභා මන්ත්‍රී යෝජනා හා ප්‍රගතිය

සභික මන්ත්‍රීවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත පිටබැද්දර ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ සභා රැස්වීම් 12 ටම නොකඩවා සහභාගී වී තිබුණේ සභික මන්ත්‍රීන් තිදෙනෙක් පමණක් වන අතර එතෙකුදු වුවද මන්ත්‍රීන් 09 දෙනෙකු රැස්වීම් සඳහා කඩින් කඩ සහභාගී වී තිබුණි. සභික දීමනා ලෙසට සියළුම මන්ත්‍රීවරුන් සඳහා රු.678,000 ක් ගෙවා තිබුණි.

2.7 අවිධිමත් ගනුදෙනු.

සභික දීමනා ගෙවීම.

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන ගැසට් පත්‍රයේ 3(1)(I) ජේදයේ පළකරන ලද නියමය පරිදි සභික දීමනා ගෙවීමේදී අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් වලට සහභාගී නොවුවහොත් එකී මාසයේ සභික දීමනා නොගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ජනවාර, මාර්තු, අප්‍රේල්, මැයි, ජුනි, අගෝස්තු හා ඔක්තෝබර් මාසවල සභා රැස්වීම් වලට සහභාගී නොවූ සභිකයන් 07 දෙනෙකු වෙත රු.95,000 ක සභික දීමනා ගෙවාතිබුණි.

03. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය.

(ඇ) ආදායම් පරිපාලනය